# මූල්‍ය කළමණාකරණය










ජී.බී. ආරියදාස

වාණිජ විද්‍යාවේදී විශේෂ(ගෞරව) උපාධි

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

ර/රත්මලවින්න මහ විද්‍යාලය

රත්මලවින්න,බලංගොඩ.

## ***මූල්‍ය කළමණාකරණය යනු***

ව්‍යාපාරයකට අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ගවලින් සපයා ගැනිම හා එම මුදල් ඵලදායී ලෙස ව්‍යාපාර කටයුතු වල ආයෝජන කරමින් අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරිමේ සිය¨ කළමණාකරණ කටයුතු මෙනමින් හඳුන්වයි .

## ***මූල්‍ය කළමණාකරණයේ අරමුණු***

මූලික අරමුණු ඃ

ව්‍යාපාර අයිතිකරුවන්ගේ ව්‍යාපාර හා සබැඳි ධනය උපරිම කිරිම

අනෙකුත් අරමුණු ඃ

ව්‍යාපාර ලාභය උපරිම කිරිම.

දිගු කාලීන මුල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරිම.

ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනිම.

ව්‍යාපාර ඉපැයුම් උපරිම කිරිම.

## ***මූල්‍ය කළමණාකරණයේ ප්‍රධාන කාර්යයන්***

- අවශ්‍ය අරමුදල් පිළිබඳ සැළසුම් කිරිම
- අවශ්‍යතා අනුව අරමුදල් සම්පාදනය කිරිම
- අරමුදල් සඵල දායක ලෙස භාවිතා කිරිම

# *<u>මුල්‍ය තීරණ</u>*

- **මුල්‍ය තීරණ වර්ණ දෙකකි**

  1 . ආයෝජන තීරණ

  2 . මුල්‍යන තීරණ

*ආයෝජන තීරණ*


ජංගම වත්කම් හා ස්ථාවර වත්කම් වල අරමුදල් යෙදවීම සම්බන්ධ තීරණ ආයෝජන තීරණය එනම් සම්පාදනය කරගත් අරමුදල් ව්‍යාපාරය විවිධ අවශ්‍යතා අතර යොදවන්නේ කෙසේද යන්න තිරණය කිරිම ආයෝජන තීරණ වලදී ප්‍රතිඵලයයි




*මුල්‍යන තීරණ*

ජංගම ස්ථාවර වත්කම් වල ආයෝජන කිරිම සඳහා අවශ්‍ය මුදල් අරමුදල් සපයා ගන්නේ කෙසේදැයි පිළිබඳ තීරණ මුල්‍ය තීරණයි , එනම් අවශ්‍ය මුල්‍ය සම්පාදනය කර ගන්නේ කෙසේද යන්නයි




මූල්‍ය කළමණාකරණ තීරණ
ආයෝජන තීරණ
මූල්‍ය තීරණ
දිගු කාලීන තීරණ
කෙටි කාලීන තීරණ
දිගු කාලීන තීරණ
කෙටි කාලීන තීරණ
ව්‍යාපාර නවීකරණය පිළිබඳ තීරණ
නැවත ස්ථාපනය කිරිම පිළිබඳ තිරණ
ව්‍යාපාර වැඩි දියුණු කිරිම තිරණ
ව්‍යාපාර විවිධාංගීකරණය පිළිබඳ තිරණ
මුදල් කළමණාකරණය පිළිබඳ තිරණ
ණයගැතියන් පිළිබඳ තීරණ
වෙළඳ තොග පිළිබඳ තිරණ .
වෙනත් කෙටිකාලින ආයෝජන පිළිබඳ තීරණ
වෙළඳ ණය හිමියන් පිළිබඳ තිරණ
බැංකු අයිරා හා අනෙකුත් කෙටි කාලීන බැංකු ණය පිළිබඳ තිරණ
ගෙවිය යුතු වියදම් පිළිබඳ තිරණ
ප්‍රාග්ධන ව්‍යුහය පිළිබඳ තිරණ
ලාභාංශ පිළිබඳ තිරණ
රඳවා ගැනිම් පිළිබඳ තිරණ
ලාභාංශ විභජනය පිළිබඳ තීරණ
හිමිකම් ප්‍රාග්ධනය රැස් කිරිම පිළිබඳ තිරණ
ණය හා හිමිකම් රැෂ් කිරිම පිළිබඳ තිරණ
ණය ප්‍රාග්ධනය ලබා ගැනිම පිළිබඳ තිරණ

***<u>ආයෝජන තීරණ හා මූල්‍ය තීරණ අතර වෙනස</u>***

- සරලවල
    - සල්ලි හොයන්නේ කොහොමද කියලා හිතන එක මූල්‍ය තීරණ වේ
    - හොයාගත්ත සල්ලි වලින් මොනවාද ගන්නේ කියලා තීරණ කරන එක ආයෝජන තීරණ වේ




*ව්‍යාපාරය අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජන කිරීමේ දි සලකා බලන කරුණු*

- ආයෝජන තීරණ
- ආයෝජන අවදානම
- ආයෝජන ප්‍රතිපත්ති
- ආයෝජන පිරිවැය
- ද්‍රවශීලතාවය
- නීතිමය තත්වය
- පාරිසරික තත්වය
- මෙහෙයුම් ක්‍රියාකාරිත්වය
- අවිනිශ්චිතතා

## මූල්‍ය සැලසුම්කරණය හා මූල්‍ය පාලන උපකරණ




- මූල්‍ය කළමණාකරණ තීරණ අනුව අරමුදල් සම්පාදනයට ගන්නා ආකාරය හා ඒවා ආයෝජනව කරන ආකාරය හඳුනා ගත් පසු යෝග්‍ය පරිදි අරමුදල් සපයා ගෙන ඒවා සඵලදායි මාර්ගවල ආයෝජන කළ යුතුය

- මූල්‍යාන තීරණ හා ආයෝජන තීරණ ප්‍රශස්ත ලෙස සිදුවුවහොත් මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණ වූ අයිතිකරුවන්ගේ ධනයඋපරිම කිරිම මනාව ඉටුවේ මේ සඳහා මූල්‍ය සැලසුම්කරණය හා පාලනය අත්‍යවශ්‍ය වේ

- මූල්‍ය සැලසුම්කරණය හා පාලන උපකරණ ලෙස අයවැයකරණය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ යොදා ගනී

## අයවැයකරණයේ මූලික උපකරණ දෙකකි

1 . මුදල් අයවැය ලේඛන

2 . ප්‍රාග්ධන අයවැයකරණය

- **මුදල් අයවැය ලේඛණ**

- නිශ්චිත අනාගත කාල ඡේදයක මුදල් ලැබීම හා මුදල ගෙවීම ඇතුලත් කොට සකස් කරනු ලබන ලේඛනයයි

## ***මුදල් අයවැය ලේඛනයේ දැකිය හැකි අපේක්ෂිත මුදල් ලැබීම හා මුදල් ගෙවීම් මාර්ග***

| මුදල් ලැබීමේ මාර්ග | මුදල් ගෙවීමේ මාර්ග |
|---|---|
| අත්පිට විකුණුම් | තොග මිලට ගැනිම |
| ජංගම නොවන වත්කම් විකිණිම | වැටුප් හා වේතනා ගෙවීම |
| ණය ගැතියන්ගෙන් ගැනිම | පොලී ගෙවීම |
| බැංකු ණය | ජංගම නොවන වත්කම් මිලදී ගැනිම |

## ***මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කර ගැනිමේ ප්‍රයෝජන***

- අනාගතයේදී මුදල් ඌනතාවයක් වේ නම් එය කල් තියා දැන ගත හැකි වීම .
- අනාගතයේදී මුදල් ඌනතාවයක් වේ නම් එය කල් තියා දැනගෙන ඊට මුහුණ දීමට සූදානම් වීමට හැකි වීම .
- සත්‍ය මුදල් ක්‍රියාකාරිත්වය හා සැසඳිම මගින් මුදල් පිලිබඳ සැළසුම්කරණය හා පාලනය පහසු වීම.
- ව්‍යාපාරික ණය ලබා ගැනිමේදී ව්‍යාපාර අනාගත මුල්‍ය තත්වය තහවුරු කරගැනිමට ඉවහල් වීම .



## ප්‍රාග්ධන ඇයවැයකරණය .

අනාගතයේදි ප්‍රතිලාභ ඉපැයිමේ අරමුණින් ව්‍යාපාර ආයතන සතුව පවතින වර්තමාන අරමුදල් වඩා සඵලදායි ලෙස දිගු කාලීන වත්කම් හෝ දිගු කාලීන ව්‍යාපෘතිවල ආයෝජනය කිරිම සැලසුම් කිරිම ප්‍රාග්ධන අයවැයකරණයයි

නිදසුන් - නව යන්ත්‍රයක් මිලදී ගැනිම

ව්‍යාපාර කටයුතු වල වර්ධනය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරිම

ප්‍රචාරණ වැඩ සැලැස්මක සඳහා වැය කරන දිගු කාලීන වියදම්

## මුල්‍ය ප්‍රකාශ වර්ග

- මුදල් ලබාගන්නා ආකාරය , මුදල් ගෙවන ආකාරය , මුදල් ලැබෙන ආකාරය වියදම් කරන ආකාරය පිළිබඳ බලා ගැනිමට ව්‍යාපාරයේ මුල්‍ය ප්‍රකාශ ඉවහල් වෙනවා

  - ලාභාලාභ හෙවත් ආදායම් ප්‍රකාශය
  - ශේෂ පත්‍රය
  - මුදල් ප්‍රවාහ ප්‍රකාශ

## මුල්‍ය ප්‍රකාශ ප්‍රධාන වශයෙන් වැදගත් වෙන්නේ ඇයි?

- ව්‍යාපාරයක පවතින ආදායම් වියදම් ගැන අවධානයකට ලක් නොවුනොත් අලාභයකට ලක් වීමේ සම්භාවිතාව වැඩියි.
- වියදම් පාලනයක් සිදුනොවේ.
- ව්‍යාපාරය පමණට වඩා ණය ගන්නවද ව්‍යාපාරයේ බංකොලොත් වුවොත් තමන්ට තිබෙන වත්කම් හා ප්‍රාග්ධනයෙන් ණය ප්‍රමාණයෙන් ගෙවා ගන්න බැරි වෙයිද ?
- බැංකු ණය දීමට තිබෙන අපහසුව ආයෝජයන් සෙවිමේ අපහසුව ව්‍යාපාරය විකිණීමේදී සිදුවන දුෂ්කරතා හා අවප්‍රමාණය වීම්.
- අනාගත මූල්‍ය තීරණ
- බැංකු ණය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශ

- යම් කාලපරිච්ඡේදයක් තුළ අයතනයේ සත්‍ය හෝ අපේක්ෂිත මුදල් ගලා ඒම සිදුවන ආකාරය මුදල් ගලා යෑම සිදුවන ආකාරය පිළිබඳ විශ්ලේශනය කර දැක්වෙන ප්‍රකාශ මුදල් ප්‍රවාහ ප්‍රකාශයයි

- මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පසුගිය කාලසීමාවක් සඳහා හෝ අනාගත කාලසීමාවක් සඳහා හෝ පිළියෙල කළ හැකිය

- ව්‍යාපාරයක මුදල් ප්‍රවාහය නැතහොත් මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් සිදුවූ ආකාරය එම ව්‍යාපාරයේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට බලපායි එම නිසා මුදල් ප්‍රවාහය පාලනය කිරිම සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආයතනයකට වැදගත් වේ

## මූල්‍ය තත්ව ප්‍රකාශය

- යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් අවසානයේ  ව්‍යාපාරයක වත්කම් වගකීම් හා හිමිකම් තත්වය පිළිබඳ පහදාදෙන ප්‍රකාශයයි මෙය ව්‍යාපාරයට අයිති සම්පත් මා ව්‍යාපාරයට අයිති නොවන බාහිර පාර්ශවයන්ට අයිති සම්පත් පිළිබඳ කියාදෙන සාරාංශ ගත ලේඛනයයි

  – මූලික ගිණුම්කරණ සූත්‍රය

    ප්‍රාග්ධන+ වගකීම් = වත්කම්

## ආදායම් ප්‍රකාශය

- යම් නිශ්චිත කාලපරිච්ඡේදයක ව්‍යාපාරයක් තුල සිදුවෙන ආදායම් වියදම් සැසදිමෙන් ව්‍යාපාරයේ ලාභ/ අලාභ තත්වය පිළිබඳ පහදා දෙන ප්‍රකාශයයි මෙය ව්‍යාපාරයේ ප්‍රගතිය පිළිබඳ නිරූපනය කියාදෙන මූලික වාර්තාවයි

## ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා විවිධ වේ

මූලිකවම වර්ග දෙකකි

1.කාරක ප්‍රාග්ධන අවශ්‍යතා කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා

2.ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා

අනෙකුත්

- දළ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා
- ශුද්ධ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා

## කාරක ප්‍රාග්ධන අවශ්‍යතා / කාලීන මූල්‍ය අවශ්‍යතා

- ව්‍යාපාරයක එදිනෙදා කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍යවන අරමුදල් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වේ

  - තොග මිලට ගැනිම
  - වැටුප් හා බිල් ගෙවීම
  - ණය හිමියන්ට ගෙවීම
  - විදුලි ගාස්තුල දුරකථන ගාස්තු ගෙවීම

සක්‍රිය ව්‍යාපාරයක වැදගත්ම මූල්‍ය අවශ්‍යතාව මෙය වේ

## ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා/දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා

- ව්‍යාපාරය ආරම්භ කිරිමේදි මෙන්ම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී මූලිකවම අවශ්‍යවන ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීමට අවශ්‍ය වන අරමුදල් මින් අදහස් කෙරේ

  - ඉඩම් ගොඩනැගිලි මිලදි ගැනීම
  - රථ වාහන මිලදි ගැනීම
  - යන්ත්‍ර උපකරණ මිලදි ගැනීම
  - කාර්යාලීය උපකරණ මිලදි ගැනීම

## දළ කාරක ප්‍රාග්ධන

- ව්‍යාපාරයක ජංගම වත්කම් වල  එකතුව දළ කාරක ප්‍රාග්ධනය වේ. ඒ සඳහා,

    - තොගය, වෙළඳ ලැබිය යුතු දෑ මුදල් හා මුදල් සමාන දෑ අයත් වේ

## ශුද්ධ කාරක ප්‍රාග්ධන

ව්‍යාපාරයක ජංගම වත්කම් වලින් ජංගම වගකීම් අඩු කල විට ලැබෙන අගය නැතහොත් ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර වෙනස මෙයයි

- ජංගම වත්කම් - ජංගම වගකීම් = ශුද්ධ කාරක ප්‍රාග්ධන

## *කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපාන සාධක*

- ව්‍යාපාරයේ ස්භාවය හා ප්‍රමාණය
- ඉල්ලුම් තත්වය හා ස්භාවය
- ණය ලබා ගැනිමේ දි ඇති ඉඩකඩ
- ණය ප්‍රතිපත්තිය
- විකුණුම් වල වර්ධනය
- සැපයුම්කරුවන්ගේ කොන්දේසි
- මිල මට්ටමට වෙනස් වීම

## **<u>ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති වුවහොත් ඇතිවිය හැකි ගැටලු</u>**

- ව්‍යාපාර කටයුතු ඇණ හිටීම.
- සැලසුම් ක්‍රියාත්මක කල නොහැකි වීම.
- ජංගම වගකීම් පියවීම.
- හදිසි කෙටි කාලීන මුල්‍ය සපයා ගැනීම සිදු වීම. හේතුවෙන් අනවශ්‍ය අධික පිරිවැයක් දැරීමට සිදුවීම.
- ණයදෙනුකරුවන් අහිමි වීම හා කීර්ති නාමයට හානි සිදු වීම.

## ***<u>ව්‍යාපාර ආයතනයකට කාරක ප්‍රාග්ධනය වැඩිකර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග</u>***

- ✓ අත්පිට විකුණුම් වැඩි කිරිම
- ✓ තොග මට්ටම තබා ගැනීමේ කාල සීමාව අඩු කිරිම
- ✓ බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම
- ✓ ලැබිය යුතු මුදල් ඉක්මණින් ලබා ගැනීම
- ✓ ණය සාධ්‍යකරණය (ව්‍යාපාරයකට ලැබිය යුතු ණය විකුණා මුදල් ලබා ගැනීම සාධ්‍යකරණයයි)

## **<u>අරමුදල් සම්පාදන මාර්ග විවිධ නිර්ණායක</u>**

1 . මුලාශ්‍ර අනුව

2 . සපයා ගන්නා ආකාරය අනුව

3. කාලය පදනම් කරගෙන

## ***ලබා ගන්නා මූලාශ්‍ර අනුව***

මූල්‍ය සම්පාදන මාර්ග

### අභ්‍යන්තර මාර්ග

නිදසුන්

- රඳවාගත් ලාභ
- ක්ෂය වෙන් කිරිම
- අතිරික්ත වත්කම් විකිණීම
- කාරක ප්‍රාග්ධනය දැඩිව පාලනය කිරිම

### බාහිර මාර්ග

නිදසුන්

- කොටස් නිකුතුව
- බැංකු ණය
- කල් බදු
- බැංකු අයිරා
- උකස්කර
- කුලී පිට ගැනුම්
- වෙළඳ ණය
- ණයකර නිකුතුව

## **සපයා ගන්නා ආකාරය අනුව**

මූල්‍ය සම්පාදන මාර්ග

### සෘජු මාර්ග

නිදසුන්

- රඳවාගත් ලාභ
- ක්ෂය වෙන් කිරිම
- කොටස් නිකුතුව
- ණයකර නිකුතුව
- අතිරික්ත වත්කම් විකිණීම

### වක්‍ර මාර්ග

නිදසුන්

- කල් බදු
- බැංකු අයිරා
- බැංකු ණය
- වාණිජ පත්‍රිකා
- සාධ්‍යකරණය

## කාලය පදනම් කරගෙන

මූල්‍ය සම්පාදන මාර්ග

| දිගු කාලීන මූල්‍ය මාර්ග | කෙටි කාලීන මූල්‍ය මාර්ග |
| --- | --- |
| නිදසුන් | නිදසුන් |
| ❑ කොටස් නිකුතුව | ❑ වාණිජ පත්‍රිකා |
| ❑ ණයකර නිකුතුව | ❑ බැංකු අයිරා |
| ❑ කල් බදු | ❑ වෙළඳ ණය |
| ❑ දිගු කාලීන බැංකු ණය | ❑ ගෙවිය යුතු වියදම් |

## විකල්ප මූල්‍ය සම්පාදන මාර්ගවල සාපේක්ෂ වාසි හා සීමා කිහිපයක් පහත දැක්වේ

### අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි

- ✓ පිරිවැය අඩු වීම
- ✓ ලබා ගැනීමේ පහසුව
- ✓ ආපසු ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති වීම
- ✓ ව්‍යාපාරයේ වගකීම් වැඩි නොවීම

### අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගවල සීමා

- ➢ විශාල අරමුදල් ප්‍රමාණයක් සපයා ගැනීමට නොහැකි වීම
- ➢ කාරක ප්‍රාග්ධන ගැටලු මතු වීම

### බාහිර මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි

- විශාල අරමුදල් ප්‍රමාණයක් සපයා ගත හැකි වීම.
- ව්‍යාපාරයේ හිමිකාරිත්වය පුළුල් කර ගත හැකි වීම .

නිදසුන් : සාමාන්‍ය කොටස් නිකුත් කිරිම

**බාහිර මූල්‍ය සම්පාදන මාර්ගවල අවාසි**

- ❑ සපයා ගැනීමේ පිරිවැය වැඩි වීම
- ❑ අරමුදල් සපයා ගැනීම පහසු නොවීම
- ❑ ඇප සුරකුම් අවශ්‍ය වීම

නිදසුන් : බැංකු ණය

- ❑ ව්‍යාපාරයේ වගකීම් වැඩි වීම.

**සෘජු මූල්‍ය සම්පාදන මාර්ලවල වාසි**

- ❖ _අමතර පිරිවැයක් දැරීමට සිදු නොවීම
- ❖ කොන්දේසි වලට යටත් වීමට සිදු නොවීම
- ❖ කවර හෝ විටෙක සපයා ගත හැකි වීම

**සෘජු මූල්‍ය සම්පාදන මාර්ලවල සීමා**

- ➢ ලාභාංශ හා පොලි ගෙවීමට සිදු වීම

**වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි**

- ➢ කළමණාකරණයට බලපෑමක් සිදු නොවීම
- ➢ හිමිකාරිත්වයට බලපෑමක් සිදු නොවීම.
- ➢ ගෙවා නිදහස් කර ගැනීමට ඇති හැකියාව

**වක්‍ර මූල්‍ය**

- ➢ නීතිරීති වලට හා කොන්දේසි වලට යටත් වීමට සිදු වීම
- ➢ ලිපි ලේඛන සකස් කිරීමට කාලයක් හා පිරිවැයක් දැරීමට සිදු වීම

## **කෙටි කාලීන මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි**

- ✓ දිගුකාලීන බැඳීම් නොමැති වීම
- ✓ ඉක්මණින් ලබා ගත හැකි වීම
- ✓ කළමනාකරණයට සිදුවන බලපෑම අඩු වීම

**කෙටි කාලීන මූල්‍ය සම්පාදන මාර්ගවල සීමා**

- ➢ කාරක ප්‍රාග්ධන ගැටලු මතු වීම
- ➢ ආපසු ගෙවීමේ කාලය අඩු වීම.

**දිගු කාලීන මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි.**

- ✓ ක්ෂණික පියවීම අවශ්‍ය නොවීම.
- ✓ වාරික වශයෙන් පියවිය හැකි වීම.

**දිගු කාලීන මූල්‍ය සම්පාදන මාර්ගවල සීමා**

- ➢ ලාභාංශ ගෙවීමට සිදුවීම.
- ➢ ඇප සුරකුම් අවශ්‍ය වීම
- ➢ ගෙවිම යුතු පොලී ප්‍රමාණය අධික වීම.

විකල්ප මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි හා සීමා සාපේක්ෂව සසදා බලා වඩාත් යෝග්‍ය මූල්‍ය සම්පාදන මාර්ගයක් හෝ මාර්ග තෝරා ගත හැකිය

## **මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේදී සැලකිලිමත් වියයුතු කරුණු**

- ➢ අවශ්‍ය මුදල් ප්‍රමාණය
- ➢ අරමුදල් අවශ්‍ය වන කාලය
- ➢ තැබිය යුතු ඇප සුරකුම් පත්
- ➢ අරමුදල් සපයා ගැනීමට හා ඒවා නඩත්තු කිරීමට දැරිය යුතු පිරිවැය

නිදසුන් : ව්‍යාපෘති වාර්තා සැකසීමේ ගාස්තු

- ➢ වත්කම් සුරැකුම් ලෙස බැදීමට යන වියදම්

  නීතිඥ ගාස්තු

  පොලී

  - ➢ ව්‍යාපාරයේ ප්‍රාග්ධන ව්‍යුහයට වන බලපෑම
  - ➢ ව්‍යාපාරයේ කළමණාකාරීත්වයට සිදුවන බලපෑම
  - ➢ අවදානම

## ආයෝජනය හා ආයෝජන තීරණ යනු

ව්‍යාපාරයක් සතු අරමුදල් ව්‍යාපාරය තුල හෝ පිටත වත්කම් වල හෝ යෙදවීම ආයෝජනය වන අතර ඒ සදහා ගන්නා තීරණ ආයෝජන තීරණ ලෙස හඳුන්වයි

ආයෝජන තීරණ වර්ග 2 කි
1 කෙටි කාලීන ආයෝජන තීරණ
2 දිගු කාලීන ආයෝජන තීරණ

ජංගම වත්කම් වල අරමුදල් යෙදවීම කෙටිකාලීන ආයෝජන තීරණ ලෙසත් ස්ථාවර වල අරමුදල් යෙදවීම දිගු කාලීන ආයෝජන තීරණ ලෙසත් නම් වේ

ආයෝජන තීරණ

කෙටි කාලීන ආයෝජන තීරණ
(කාරක ප්‍රාග්ධන තීරණ)
නිදසුන්:

- මුදල්
- වෙළඳ ණයගැතියෝ
- තොග
- කෙටි කාලීන ආයෝජන
- සුරැකුම්පත්

දිගු කාලීන ආයෝජන තීරණ
(ප්‍රාග්ධන ආයෝජන තීරණ)
නිදසුන් :

- ව්‍යාපාරය ස්ථානගත කිරිම
- ව්‍යාපාරය නවීකරණය හා පුළුල් කිරිම
- ව්‍යාපාර විවිධාංගීකරණය කිරිම
- ස්ථාවර වත්කම් / දිගුකාලීන සුරැකුම්පත්

**ව්‍යාපාර සර්ථකත්වයට අයෝජන තීරණ වල වැදගත්කම**

1 ව්‍යාපාරයේ සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

2 විකල්ප ආයෝජන අවස්ථා හඳුනාගත හැකි වීම

3 වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජන තෝරා ගත හැකි වීම

**<u>ආයතනයක් අරමුදල් ආයෝජනය කිරීමේදී සලකා බලන කරුණු</u>**

1 ආයෝජනයේ ප්‍රතිලාභ
2 ආයෝජනයේ අවදානම
3 ද්‍රවශීලතාව
4 පරිසර සාධක
5 අවිනිශ්චිතතා
6 ආයතනයේ ප්‍රතිපත්ති
7 ආයෝජනයේ පිරිවැය
8 නීතිමය තත්ව
9 මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට වන බලපෑම

## <u>මූල්‍ය අනුපාත වර්ග</u>

මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය

මූල්‍ය කලමණාකරණයේදී අවශ්‍ය වන තොරතුරු ආයතනයේ මූල්‍ය ප්‍රකාශ මඟින් ලබා ගත හැක ( ආදායම් ප්‍රකාශය , ශේෂ පත්‍රය , මුදල් ප්‍රවාහ ප්‍රකාශය)

- එම ප්‍රකාශ කිසියම් ක්‍රමවත් ආකාරයකට අධ්‍යනය කිරිම මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය ලෙස හැඳින්වේ . මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන ක්‍රමවේදය වනුයේ මූල්‍ය අනුපාත විශ්ලේෂණයයි

මූල්‍ය අනුපාත ගණනය කිරිමේ ගිණුම්කරණය ප්‍රකාශ විශ්ලේෂණය කිරිමේ ශිල්ප ක්‍රමය අනුපාත විශ්ලේෂණයයි

මේ තොරතුරු මඟින් මූල්‍ය ශක්තීන් දුර්වලතා අනාගතයේදි ඇති විය හැකි  අවස්ථා හා තර්ජන පිළිබඳව අභ්‍යන්තර විශ්ලේෂණයක් මෙන්ම පුරෝකථනයක්ද සිදු කල හැක

## <u>ව්‍යාපාර ආයතනයක මූල්‍ය තත්වය පෙන්නුම් කරන ප්‍රධාන සාධක කීපයක් ඇත</u>

- ව්‍යාපාරයේ ලාභදායිත්වය
- ව්‍යාපාරයේ මූල්‍ය තෝලනය
- ව්‍යාපාරයේ ද්‍රවශිලතාවය
- ව්‍යාපාර ගනුදෙනු කරන මූල්‍ය වෙළඳපොළ තත්වය
- ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය

## <u>මූල්‍ය අනුපාත හා ඒවායේ ප්‍රයෝජන</u>

<u>ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය, සම්බන්ධතාවය පිළිබිඹු කරන දර්ශකයකි,  ව්‍යාපාරයක ක්‍රියාකාරිත්වය හා මූල්‍ය තත්වය අනුව ශුද්‍ධ විශ්ලේෂණයක් මඟින් ව්‍යාපාර තීරණ හා මෙහෙය වීම සිදු කිරිමට ඉවහල් වේ . එනම්,</u>

**<u>ප්‍රයෝජන</u>**

- ✓ <u>ව්‍යාපාරයේ ලාභාදායීත්වය, ද්‍රවශීලිත්වය හා ප්‍රාග්ධන තෝලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනිම</u>
- ✓ *<u>තරගකාරී ආයතන සමඟ සසදා බලා ව්‍යාපාරයෙහි තත්වය හඳුනා ගැනිම</u>*

**<u>මූල්‍ය අනුපාත වර්ග</u>**

**<u>1 ද්‍රව ශීලතා අනුපාතය</u>**

**<u>1.1 ජංගම අනුපාතය</u>**

ජංගම අනුපාතය = ජංගම වත්කම් / ජංගම වගකීම්

-ජංගම වත්කම් හා වගකීම් අතර සම්බන්ධතාවය මෙන්ම වගකීම් වලට මුහුණු දීමට ජංගම වත්කම් වල ඇති හැකියාව පෙන්නුම් කරන්නෙකි

**<u>1.2 ක්ෂණික අනුපාතය</u>**

ද්‍රව ශීල වත්කම් ජංගම වත්කම් - (බඩු තොගය + කලින් ගෙවූ වියදම්)

ජංගම වගකීම්

ජංගම වගකීම ද්‍රවශීල වත්කම් අතර ඇති සම්බන්ධතාවය පෙන්නුම් කරන අතර ජංගම වගකීම් වලට මුහුණ දීමට ඇති ක්ෂණික හැකියාව හෙවත් ද්‍රවශීල වත්කම් වල හැකියාව පෙන්නුම් කරන්නෙකි

**<u>2. ලාභදායිත්වය අනුපාත</u>**

2.1 **<u>දළ ලාභ අනුපාත</u>**

ව්‍යාපාරයේ විකුණුම් වලට අනුව දළ ලාභය ප්‍රතිශතයක් ලෙස පෙන්නුම් කරන අනුපාතයයි

දළ ලාභ අනුපාතය = <u>දළ ලාභය</u> ෆ100

විකුණුම්

## 2.2 ශුද්ධ ලාභ අනුපාතය (බදු පෙර ලාභය

ව්‍යාපාරයේ විකුණුම් වලට අනුව ශුද්ධ ලාභය ප්‍රතිශතයක් ලෙස පෙන්නුම් කරන අනුපාතයයි

ශුද්ධ ලාභ අනුපාතය = ශුද්ධ ලාභය * 100

විකුණුම්

__2.3 ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය (ඍැඑමරබ දබ සබඞෑඑපැබඑ*

මෙය මුළු ආයෝජන අනුපාතිකය ව්‍යාපාරය ඉපයුම් ප්‍රමාණයට කොතෙක් ද යන්න පෙන්නුම් කරන අනුපාතිකයයි එමෙන්ම මෙහිදි ඒ තමා ආයෝජනය කළ මුදල කොපමණ කාලසීමාවක ලැබෙයිද යන්න ආයෝජකයාට වටහා ගත හැක

ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය =බදු පසු ශුද්ධ ලාභය+පොලිය*100

මුළු වත්කම් (යෙදූ ප්‍රාග්ධනය)

2.4 හිමකම් මත ප්‍රතිලාභ අනුපාතිකයඃඍැඑමරබ දබ ෑමසඑහ සාමාන්‍ය කොටස් හිමියන් විසින් සපයන ලද ප්‍රාග්ධන සඳහා උපයන ප්‍රතිලාභ ප්‍රතිශතයක් ලෙසට පෙන්නුම් කරන අනුපාතිකයයි

හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය = බදු පසු ශුද්ධ ලාභය෴ වරණිය ලාභාංශ * 100

හිමිකම් ප්‍රාග්ධනය

ව්‍යාපරය කොතරම් කාර්යක්ෂමව ක්‍රියාකරනවාද යන්න මෙන්ම ව්‍යාපාරයේ ලාභය ක්ෂේත්‍රය හා සංසන්දනය කරන විට දුර්වලද හඳුනාගත හැකි ව්‍යාපාර ක්‍රියාකාරිත්වය ගැටලු හෝ ශක්තිමත් භාවය පෙන්නුම් කරන අනුපාතයයි

## 3. ක්‍රියාකාරි අනුපාත / මෙහෙයුම් කර්යක්ෂමතා අනුපාතය

ව්‍යාපාරය කොතරම් කාර්යක්ෂමව ක්‍රියා කරනවාද යන්න මෙන්ම ව්‍යාපාරයේ ලාභය කේෂ්ත්‍රය හා සංසන්දනය කරන විට දුර්වලද හඳුනාගත හැකි ව්‍යාපාරය ක්‍රියාකාරිත්වය ගැටලු හෝ ශක්තිමත්භාවය පෙන්නුම් කරන අනුපාතියයි.

## 3.1 තොග පිරිවැටුම් අනුපාතය

යම් කාලපරිච්ඡේදයක දී ව්‍යාපාරයෙන් තොගය විකුණුම් බවට පත්වන ක්‍රියාවලිය තොග පිරිවැටුම් අනුපාතයයි

තොග පිරිවැටුම් අනුපාතයයි = විකුණුම් පිරිවැය

සාමාන්‍ය තොගය (ආරම්බක තොගය¸ අවසාන තොගය /2 )

## 3.2 ණය ගැති පිරිවැටුම් අනුපාතය

යම් කාලපරිච්ඡේදයක දී ව්‍යාපාරයෙන් ණය ගැතියන් මුදල් බවට පත් කිරිමේ ශීඝ්‍රතාවය එනම් ව්‍යාපාරය කොතරම් විදිහට කාර්යක්ෂමව ණයගැතියන්ගෙන් මුදල් එකතු කරන්නේදැයි පෙන්නුම් කරන අනුපාතයයි

ණය ගැති පිරිවැටුම් අනුපාතය = ණයට විකුණුම්

සාමාන්‍ය ණයගැතියෝ (ආරම්භක ණය ගැග + අවසාන ණය ගැ. / 2)

## 3.3 ණයහිමි පිරිවැටුම් අනුපාතය

යම් කාලපරිච්ඡේදයක දී ව්‍යාපාරයෙන් ණයහිමියන් නිරවුල් කිරිමේ ශීඝ්‍රතාවය එනම් ව්‍යාපාරය කොතරම් විදිහට කාර්යක්ෂමව ණයහිමියන් මුදල් නිරවුල් කරන්නේදැයි පෙන්නුම් කරන අනුපාතයයි

ණයහිමි පිරිවැටුම් අනුපාතය = ණයට ගැණුම්

සාමාන්‍ය ණයහිමියෝ (ආරම්භක ණය හිග + අවසාන ණය හි. / 2)

## 3.4 සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය

- ව්‍යාපාරයේ ණයගැතියන්ගෙන් ණය එකතු කර ගැනීමේ සාමාන්‍ය කාලය මෙමඟින් පෙන්නුම් කරයි

සාමාන්‍ය ණය එකතු කිරිමේ කාලය = සාමාන්‍ය ණයගැතියෝ

වාර්ෂික ණයට විකුණුම් / 365

සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය = දින 365

ණයගැති පිරිවැටුම් අනුපාතය

## <u>3.5 සාමාන්‍ය ණයහිමියන්ට මුදල් ගෙවීමේ කාලය</u>

ව්‍යාපාරයේ ණයහිමියන්ට මුදල් ගෙවීමේ සාමාන්‍ය කාලය මෙමඟින් පෙන්නුම් කරයි

සාමාන්‍ය ණයහිමි මුදල් ගෙවීමේ කාලය = සාමාන්‍ය ණයහිමියෝ

වාර්ෂික ණයට ගැණුම් / 365

සාමාන්‍ය ණයහිමි මුදල් ගෙවීමේ කාලය = දින 365

ණයහිමි පිරිවැටුම් අනුපාතය

## <u>3.6 මුදල් මෙහෙයුම් ක්‍රියාවලියේ දින ගණන</u>

## <u>(Cash operation cycle)</u>

- මෙහිදි අදහස් වෙන්නේ ව්‍යාපාර ක්‍රියාවලිය තුලින් මුදල් ව්‍යාපාරයට ගලා එන කාලසීමාව

තොග විකුණුම් බවට පත්වීමේ කාල සීමාව

සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය

(සාමාන්‍ය ණයහිමි මුදල් ගෙවීමේ කාලය)

මුදල් මෙහෙයුම් ක්‍රියාවලියේ දින ගණන

තොග විකුණුම් බවට පත්වීමේ කාල සීමාව = <u>සාමාන්‍ය තොග මට්ටම</u>

වාර්ෂික ණය විකුණුම් / 365

## 3.7 මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය

ව්‍යාපාරයය මුළු වත්කම් හා විකුණුම් අතර ඇති සම්බන්ධතාව පෙන්නුම් කරන අනුපාතය හෙවත් වත්කම් වලින් විකුණුම් ගණනය කිරිමේ ඇති හැකියාව කාර්යක්ෂමතාවය පෙන්නුම් කරන අනුපාතයයි

මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය = විකුණුම් / මුළු වත්කම්

## 3.8 ණය අනුපාතය

ණය අනුපාතය යනු ව්‍යාපාර ආයතනය මුළු ප්‍රාග්ධනය කොපමණ ප්‍රමාණයන් ණය ප්‍රාග්ධනය සමන්විත වේද යන්න පෙන්නුම් කරන්නෙකි

ණය අනුපාතය = ස්ථාවර පොලියක් ගෙවන ප්‍රාග්ධනය * 100 / මුළු ප්‍රාග්ධනය

ස්ථාවර පොලියක් ගෙවන ප්‍රාග්ධන = දිගු කාලීන ණය

මුළු ප්‍රාග්ධනය = කොටස් ප්‍රාග්ධනය/ දිගු කාලීන ණය

මෙහිදී අගය 50%ට වඩා වැඩිවන විට අධිතෝලන තත්වයක් ලෙසද 50%වඩා අඩුවන විට අව තෝලන තත්වයක් බවට පෙන්වා දිය හැකිය

## 3.9 ණය හිමිකාරිත්ව අනුපාතය / ණය ස්කන්ධ අනුපාතය (Debt / Equity / Ratio)

-හිමිකම් ප්‍රාග්ධනය ණය ප්‍රාග්ධනයක් (ස්ථිර පොලියක් ගෙවන ප්‍රාග්ධනය) අතර සම්බන්ධතාවයක් පෙන්නුම් කරන අනුපාතය ණය හිමිකාරිත්ව අනුපාතයි

ණය හිමිකාරිත්ව අනුපාතය = ස්ථිර පොලියක් ගෙවන ප්‍රාග්ධනය * 100 / හිමිකම් ප්‍රාග්ධනය

ණය හිමිකාරිත්ව අනුපාතයේ හි අගය 1 ට වඩා අඩුනම් අවතෝලන තත්වයක් ලෙසට හැඳින්විය හැකිය.

## අධි තෝලන හා අව තෝලන තත්වය

## අධි තෝලන තත්වය ( High Gearing Scenario)

- මුල්‍ය අර්බුදයකදී අධි තෝලනයක් තිබීම ඉතා භයානක දෙයකි ව්‍යාපාරයේ පැවැත්ම මෙන්ම නීතිමය තත්ව රාශියකට මුහුණ දීමට සිදුවේ අධි තෝලනය හෙවත් ණය ප්‍රාග්ධනය හිමිකම් ප්‍රාග්ධනයට වඩා වැඩි වීම වාසි හා අවාසි තත්වයකට මුහුණ දීමට සිදු වේ

- ඉහල ලාභදායි ව්‍යාපාර පැවති නම් අ අධි තෝලන ප්‍රාග්ධන ව්‍යුහය පැවතීම වාසිදායකය නමුත් අලාභ තත්වයකදී ඉතා අවාසිදායකය පැවැත්මට සම්පූර්ණයෙන්ම බලපානු ඇත

## අව තෝලන තත්වය ( Low Gearing Scenario )

අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය අඩු තත්වයක් මෙහිදි පෙනෙන අතර අධි තෝලන තත්වයකදී සිදුවන වාසි අවාසි කණපිට හැර වේ

## 3.10 පොලී ආවරණ අනුපාතය / පොලී ඉපයීමේ වාර අනුපාතය

**(Investment covering ratio)**ව්‍යාපාර ඉපයීම් වලින් පොලී කී වාරයක් ගෙවිය හැකිද යන්න පෙන්නුම් කරන අනුපාතය මින් අදහස් කෙරේ මෙය ලාභදායිත්ව අනුපාත යටතේ ගැණුනත් මෙය ව්‍යාපාර ණය ගැනීමේ ක්‍රියාවලියේදී ණය ගෙවීමේ හැකියාව තීරණය වෙන අනුපාතයක්

$$\text{පොලී ආවරණ අනුපාතය} = \frac{\text{පොලී හා බදු පෙර ලාභය}}{\text{පොලිය}} * 100$$

## <u>මුල්‍ය ආයතන</u>


- ශ්‍රී ලංකාවේ මුල්‍ය පද්ධතිය යනු

ආර්ථිකයක මුල්‍ය තීරණ ක්‍රියාත්මක කිරිමේ නිරත ව සිටින මුල්‍ය වෙලඳපොළ මුල්‍ය ආයතන මුල්‍ය උපකරණ මුල්‍ය යටිතල පහසුකම් මධ්‍යම බැංකුව ආදියෙන් සමන්විත පද්ධතිය මුල්‍ය පද්ධතිය වේ

-මුල්‍ය පද්ධතිය තුළ සිදුවන ප්‍රධාන හ වැදගත් කාර්ය වන්නේ මුල්‍ය අතරමැදිකරණයයි

-අරමුදල් අතිරික්තයක් ඇති ඒකක හා අරමුදල් හිගයක් ඇතිඒකක සම්බන්ධ කෙරෙන යාන්ත්‍රණය ක්‍රියාත්මක කරනු ලබන්නේ මුල්‍ය අතරමැදිකරණය මගිනි

### <u>මුල්‍ය පද්ධතියේ සංයුතිය</u>



රටක මුල්‍ය වෙළඳපොලෙහි ක්‍රියාත්මක වන බැංකු නොවන සියලුම ආයතන මුල්‍ය ආයතන වේ

ශ්‍රී ලංකාවේ මධ්‍යම බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව වේ

ශ්‍රී ලංකා මහ බැංකුව මුල්‍යායතන පහත පරිදි වර්ග කර ඇත

01. බැංකු අංශය

- ශ්‍රී ලංකා මහ බැංකුව
- බලපතිලාභ වාණිජ බැංකු
- බලපතිලාභ විශේෂිත බැංකු

02. තැන්පතු භාර ගන්නා අනෙකුත් මුල්‍ය ආයතන

- බලපත්‍රලාභී මුදල් සමාගම්
- සමූපකාර ග්‍රාමීය බැංකු
- සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති

03. අනෙකුත් විශේෂිත මුල්‍යායතන

- විශේෂිත කල්බදු මුල්‍යකරය සමාගම්
- ප්‍රාථමික අලෙවිකරුවෝ
- කොටස් තැරැව්කාර සමාගම්
- වෙළෙඳපොළ අතරමැදියෝ
- ව්‍යාවසායක ප්‍රාග්ධන සමාගම්
- ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන

04.ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන

- රක්ෂණ සමාගම්
- සේවක අර්ථසාධක අරමුදල
- රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල
- අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල

- **<u>ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපොළ තුළ ක්‍රියාත්මක වන මූල්‍ය උපකරණ ලෙස</u>**

භාණ්ඩාගාර බිල්පත්

භාණ්ඩාගාර බැඳුම්කර

සාමාන්‍ය කොටස්

වරණීය කොටස්

වාණිජ පත්‍රිකා

තැන්පතු සහතික

සංගමික ණයකර

## <u>රටක මූල්‍ය ක්‍රමයේ සංවිධිත ක්‍රියාකාරීත්වය හා ස්ථායිතාව</u>

නිදසුන් :

1. **තත්කාලීන දළ පියවීම** (RIGS)

   (Real time gross settlement system)

2. **ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය**(CTS)

   (Image cheque clearing)

3. **නිර්ලේඛන සුරකුම්පත් පියවීමේ පද්ධතිය** (SSSS)

   (Script less securities settlement system)

4. **ජගත් අන්තර් බැංකු සන්නිවේදන සංගමය** (SWIFT)

   (Society for world wide interbank financial telecommunication)

## <u>මූල්‍ය වෙළඳපොළ යනු?</u>

අරමුදල් සපයන්නන් හා අරමුදල් ඉල්ලුම් කරන්නන් සම්බන්ධ කිරීම සඳහා පවත්නා ස්ථානයක් හෝ අවකාශයක් හෝ මූල්‍ය වෙළඳපොළක් ලෙස හැඳින්වේ මූල්‍ය වෙළඳ පොළෙහි මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීම සිදු කරයි

## මූල්‍ය වෙළඳපොළෙහි සංයුතිය

1 අන්තර් බැංකු ඒකෂණ ණය වෙළඳපොළ

2 දේශීය විදේශීය විනිමය වෙළඳපොළ

3 රජයේ සුරැකුම්පත් වෙළඳපොළ

- භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ
- භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ

4 සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

- වාණිජ පත්‍රිකා වෙළඳපොළ
- සාංගමික බැඳුම්කර වෙළඳපොළ
- කොටස් වෙළඳපොළ

**<u>මූල්‍ය උපකරණ කල්පිරීමේ කාලය පදනම් කරගෙන මූල්‍ය වෙළඳපොළ. පහත පරිදි වර්ග කළ හැකිය</u>**

1 මුදල් වෙළඳපොළ

2 ප්‍රාග්ධන වෙළඳපොළ

මූල්‍ය වෙළඳපොළ

- මුදල් වෙළඳපොළ
  - අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ
  - දේශීය විදේශීය විනිමය වෙළඳපොළ
  - භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ
  - වාණිජ පත්‍රිකා වෙළඳපොළ
- ප්‍රාග්ධන වෙළඳපොළ
  - භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ
  - සාංගමික බැඳුම්කර වෙළඳපොළ
  - කොටස් වෙළඳපොළ

- කෙටි කාලීන මුල්‍ය උපකරණ මිලදී ගැනීම හා විකිණීමට අදාල වෙළඳපොළ මුදල් වෙළඳපොළ ලෙස හැඳින්වේ

- මුදල් වෙළඳපොළ පහත පරිදි උප පොළවලින් සමන්විතය.

## 1 අන්තර් බැංකු ඒක්ෂණ ණය පොළිය

වාණිජ බැංකු අතර කෙටි කාලීන ණය ඉල්ලුම් සහ ණය සැපයුම් සිදුවන වෙළඳපොළයි ද්‍රව ශීලතා හිඟයෙන් පෙළෙන බැංකු සිය ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අතිරික්ත ද්‍රවශීලතාවයක් සහිත වාණිජ බැංකු වලින් දින හතකින් හෝ ඊට අඩු කාලයකින් හෝ පියවීමට යටත්ව මුදල් ණයට ගැනීම ඒක්ෂණ ණය ගණුදෙනු ලෙස හැඳින්වෙන අතර එම ගණුදෙනු සිදුවන වෙළඳපොළ අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ ලෙස හැඳින්වේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති එම බැංකු සතු සංචිත ගිණුම් හරහා මෙම ගණුදෙනු සිදු කරයි

## 2 දේශීය විදේශීය විනිමය වෙළඳපොළ

රටෙහි විදේශ විනිමය යොදා ගෙන කෙටි කාලීන ණය ගැනීම හා කෙටි කාලීන ණය සැපයීම සිදුවන වෙළඳපොළයි  නැතහොත් වාණිජ බැංකුවල විදේශ ව්‍යාවහාර මුදල් ගණුදෙනු වලට අදාලව සිදුකෙරෙන කටයුතු මෙනමින් හැඳින්වේ අපනයනකරුවන් ලබා ගන්නා විදේශ මුදල් වාණිජ බැංකුවලට විකුණා ශ්‍රී ලංකා රුපියල් ලබා දී විදේශ මුදල් මිලදී ගැනීම ණයවර ලිපි නිකුත් කිරීම විදේශ බැංකු අණකර නිකුත් කිරීම ආදි ගණුදෙනු මෙහිදී සිදු වේ

- **භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ**

රජයට අවශ්‍ය කෙටි කාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුල්‍ය උපකරණය භාණ්ඩාගාර  බිල්පත් මුල්‍ය උපකරණය හා භාණ්ඩාගාර බිල්පත් ලෙස හඳුන්වයි මෙම භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිලදී ගැනීම සිදුවන වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ යි

- **භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළ**

ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික අලෙවිකරුවන්ට භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීම භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළයි

- **භාණ්ඩාගාර බිල්පත් ද්විතියික වෙළඳපොළ**

ප්‍රාථමික වෙළඳපොළක් මිලට ගත් භාණ්ඩාගාර බිල්පත් කල් පිරෙන තෙක් තබා නොගෙන භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිලදී ගැනීම සිදුවන වෙළඳපොළයි

## ●<u>වාණිජ පත්‍රිකා වෙළඳපොළ</u>

සමාගම් තම කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිකුත් කරනු ලබන පත්‍රිකා විශේෂය වාණිජ පත්‍රිකා ලෙස හඳුන්වයි වාණිජ පත්‍රිකා විකිණීම හා මිලදී ගැනීම සිදුවන වෙළඳපොළ වාණිජ පත්‍රිකා වෙළඳපොළ ලෙස හඳුන්වයි

## <u>ප්‍රාග්ධන වෙළඳපොළ</u>

-වර්ෂයකට වඩා වැඩි කාලයකදී කල් පිරෙන මූල්‍ය උපකරණ ගනුදෙනු සිදුවන වෙළඳපොළ මේ නමින් හඳුන්වයි එනම් දිගු කාලීන අරමුදල් අවශ්‍යතා ඇති පාර්ශව හා දිගුකාලීන අරමුදල් අතිරික්තතා ඇති පාර්ශව අතර ගණුදෙනු සිදුවන වෙළඳපොළ ප්‍රාග්ධන වෙළඳපොළ නම් වේ

## <u>භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ</u>

-රජයට අවශ්‍ය මධ්‍යම හා දිගුකාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් විශේෂය භාණ්ඩාගාර බැඳුම්කර ලෙස හැඳින්වේ මේවා හුවමාරු වෙන වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ නම් වේ සුරක්ෂිත මූල්‍ය උපකරණයක් වන මෙය රුපියල් දස දහස් ගුණිතයන්ගෙන් යුක්තව මිලදී ගත හැකිය වසර දෙකේ සිට තිහක් තෙක් කල් පිරෙන සීමාවන්ගෙන් යුක්තව නිකුත් කරයි

- <u>සාංගමික බැඳුම්කර වෙළඳපොළ</u>

රාජ්‍ය සංස්ථා හා සීමිත පොදු සමාගම් විසින් මධ්‍ය හා දිගුකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා නිකුත් කරන බැඳුම්කර (ණයකර) අලෙවි කිරිම සම්බන්ධ කටයුතු සිදු කෙරෙන වෙළඳපොළ මෙය වේ සාංගමික බැඳුම්කර කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කර කොටස් වෙළඳපොළේ හුවමාරු කිරිමටද හැකියාව ඇත

- <u>කොටස් වෙළඳපොළ</u>

ලැයිස්තුගත සමාගම් විසින් නිකුත් කරන කොටස් හා ණයකර ආදී සුරැකුම්පත් මිලදී ගැනීම හා විකිණීම සිදුකරන වෙළඳපොළ කොටස් වෙළඳපොළ වේ

## <u>කොළඹ කොටස් හුවමාරුව</u>

- ලැයිස්තුගත සමාගම්වල කොටස් මිලදී ගැනීම හා විකිණීම පරිපාලනය කරන ආයතනය කොළඹ කොටස් හුවමාරුවය ලෙස හැඳින්වේ

- කොළඹ කොටස් හුවමාරුව ඇපයෙන් සීමිත සමාගමකි.

- එහි පූර්ණ සමාජිකයන් ලෙස තැරැව්කාර සමාගම් ක්‍රියාත්මක වේ මෙම තැරැව්කාර සමාගම් කොළඹ කොටස් හුවමාරුවේ අතරමැදියන් ලෙස කටයුතු කරයි කොළඹ කොටස් හුවමාරුවේ කාර්ය විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ

## කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකා ආර්ථිකයට වැදගත් වීමට හේතු කීපයක් පහත දැක්වේ

- පුද්ගලයන් හා ආයතන ආයෝජන සඳහා දිරිගැන්වීම.
- සමාගම් වලට විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකිය
- සමාගම් වල කොටස් සඳහා ද්විතීයික වෙළඳපොළක් ඇතිවීම
- විදේශ ආයෝජකයන් රටට අද්දවාගත හැකි වීම
- රජයේ සුරැකුම්පත් අලෙවි කිරීමෙන් රජයට අවශ්‍ය අරමුදල් ලබා ගත හැකිවීම
- සමාගම් වල කොටස් වලට වටිනාකමක් නිර්මාණ වීම
- සමාගම් වල කීර්ති නාමය හා ප්‍රතිරූපය ඉහල යාම.

### <u>ප්‍රාථමික වෙළඳපොළ</u>

- කොටස් නිකුත් කරන සමාගමකින් ආයෝජකයින් විසින් සෘජුවම කොටස් මිලට ගැනීම ප්‍රාථමික වෙළඳපොළය

### <u>ද්විතීයික වෙළඳපොළ</u>

- කොළඹ කොටස් වෙළඳපොළෙන් ආයෝජකයන් කොටස් මිලට ගැනීම ද්විතීයික වෙළඳපොළයි

## <u>සීමිත පොදු සමාගමකට කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි විය හැකි ආකාර තුනකි. එනම්,</u>

1 **මුලික ප්‍රසිද්ධ නිකුතුවකු මඟින්** සමාගමක් පළමු වරට කොටස් නිකුත් කිරීමක් මඟින් මහජනයාට දායක වීමට ඇරයුම් කර කොටස් වෙළඳපොළේ ලැයිස්තු ගත කිරීම

2. **විකුණුම් අර්පණයක් මඟින්** දැනටමත් කොටස් නිකුත් කර ඇති සමාගමක් මහජනතාව සතුව ඇති කොටස් වෙළඳපොළෙන් විකිණීමට ඉදිරිපත් කිරිම සඳහා ලැයිස්තුගත කිරිම

3.**හඳුන්වා දීමක් මඟින්** මහජනතාවට කොටස් නිකුත් කිරීමක් නොකරන හඳුන්වාදෙන අවස්ථාවේදීම කොළඹ කොටස් හුවමාරුව හරහා ම කොටස් නිකුත් කිරිම

## <u>කොළඹ කොටස් වෙළඳපොළේ සමාගම් ලැයිස්තුගත කිරිමේ දී සියලුම සමාගම් පුවරු දෙකක් යටතේ ලැයිස්තුගත කිරිම</u>

1.ප්‍රධාන පුවරුව

2.දිරිසවි පුවරුව

<u>ප්‍රධාන පුවරුව</u>

- විශාල ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත සමාගම් සඳහා වෙන්වු පුවරුවයි

<u>ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් ලැයිස්තු ගත වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා</u>

° සමාගම් ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 500ට නොඅඩු වීම

°ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට පෙර අවම වශයෙන් අඛන්ඩව වසර 3ක් බදු පෙර ශුද්ධ ලාභ ලබා ගැනීම

°ව්‍යාපාරයේ පවතින ශුද්ධ වත්කම් ලැයිස්තු ගත කිරීමට ඉල්ලුම් කළ දිනයේ සිට ආසන්න වර්ෂ දෙකක විගණනය කරන ලද මුල්‍ය වාර්තා මඟින් තහවුරු වීම නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 25% ක් මහජනතාව සතු වීම

- <u>දිරිසවි පුවරුව</u>

  - සීමිත ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත ව ආරම්භ වූ සමාගම් ලැයිස්තුගත කිරිමට වෙන්වූ පුවරුව දිරිසවි පුවරුවයි

දිරිසවි පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා කිහිපයකි

-ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් කෝටි 10ට නොඅඩු විය යුතුය

-නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 10 මහජනයා සතු වීම

-ව්‍යාපාරයේ පවතින ශුද්ධ වත්කම් ලැයිස්තුගත කිරිමට ඉල්ලුම් කළ දිනට වසරක විගණනය කරන ලද මුල්‍ය වාර්තා මගින් තහවුරු විය යුතුය

-සමාගමේ ක්‍රියාකාරි කාලසීමාව අවම වශයෙන් වසරක් වීම

- <u>වොච් ලිස්ට් පුවරුව</u>

  – කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කිරිමේ කොන්දේසි කඩ කරන හෝ නොපිළිපදින සමාගම් ඇතුලත් කරන පුවරුව වේ මෙය පෙර කඩ කල පුවරුව ලෙස හඳුන්වා ඇත

- **කොළඹ කොටස් හුවමාරුවේ හි ගනුදෙනු වන සුරැකුම්පත් කිහිපයක් පහත දැක්වේ**

  - ✓ සාමාන්‍ය කොටස්
  - ✓ වරණීය කොටස්
  - ✓ කොටස් බලපත්‍ර
  - ✓ සාංගමික ණයපත්
  - ✓ රජයේ සුරැකුම්පත්

- **<u>සාමාන්‍ය කොටස්</u>**

-සාමාන්‍ය කොටස් මිලදී ගන්නා ආයෝජකයෝ එම සමාගමේ අයිතිකරුවෝ වෙති මෙම කොටස් මිලදී ගන්නා ආයෝජකයන්ට සමාගම ලබන ලාභය යම් ප්‍රතිශතයක් හිමි වන නමුත් හිමිවන ලාභාංශ ස්ථිර නොවේ එම නිසා අවදානම වැඩිය වාර්ෂික මහ සභා රැස්වීම්වලට සහභාගි වීමට අයිතිය හිමිවේ පාලන බලතල හිමි වේ සාමාන්‍ය කොටස් වර්ග 2 කි

1 ඡන්ද බලය සහිත සාමාන්‍ය කොටස්

2 ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස්

- ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස් හිමියන්ට ඡන්ද බලය හිමි නොවුවත් සාමාන්‍ය කොටසි වලට හිමි අනෙකුත් සියලු වරප්‍රසාද ලැබේ

- **<u>වරණීය කොටස්</u>**

-නිශ්චිත ලාභ ප්‍රතිශතයක් හිමි සමාගම විසුරුවා හරින අවස්ථාවකදී ප්‍රාග්ධනය ආපසු ගෙවන විටදී ප්‍රමුකත්වයක් හිමිවන කොටස් වරණීය කොටස් වේ මෙම කොටස් හිමියන්ට සමාගමේ අයිතිය හිමි නොවේ අවදානම අඩුය පාලන බලතල හිමි නොවේ

- **<u>කොටස් බලපත්‍ර</u>**

-අනාගතයේදී නිශ්චිත මිලකට සමාගමක කොටස් මිලට ගැනීමේ අයිතිය ලබා දෙමින් වර්තමානයේ සමාගම විසින් නිකුත් කරන ලියවිල්ල කොටස් බලපත්‍රයයි කෙසේ වුවද කොටස් ආයෝජයකයෙන් ආයෝජකයකු ලබන ප්‍රාග්ධන ලාභ හැර අනෙකුත් ප්‍රතිලාභ ලැබීමට නම් කොටස් බලපත්‍රය කොටස් බවට පත්වන තුරු ලග තබා ගත යුතුය

- **<u>සාංගමික ණයකර</u>**

-සමාගමක ණය ප්‍රාග්ධනය ලබා ගැනීම සඳහා සමාගමක් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් විශේෂයකි ලැයිස්තුගත සමාගම් විසින් නිකුත් කරන ලැයිස්තු ගත ණයකර කොටස් වෙළඳපොළේ හුවමාරු කල හැකිය ණය කර ආයෝජකයන්ට නිශ්චිත පොළි ප්‍රතිශතයක් හිමි වේ

- **<u>රජයේ සුරකුම්පත්</u>**

- රජය විසින් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මින් අදහස් වේ අවදානම ඉතා අවම ආයෝජන ලෙස මේවා සැලකේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරසඳහා වන පොළී අනුපාත ස්ථාවර නොවන අතර රජය කලින් කලට විවිධ පොළී අනුපාතයන් යටතේ මේවා නිකුත් කරනු දැකිය හැකිය

## <u>කොටස් වෙළඳපොළේ හුවමාරු වන සුරකුම්පත් වල ආයෝජනයෙන් ලැබෙන සෘජු හා වක්‍ර ප්‍රතිලාභ පහත දැක්වේ</u>

### <u>සෘජු ප්‍රතිලාභ</u>

□**ලාභාංශ**

සමාගමක් තම ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමෙන් උපයන ශුද්ධ ලාභයෙන් සමාගමේ කොටස් හිමියන්ට බෙදාහරින ප්‍රමාණයෙන් ලාභාංශ වේ සමාගම් සාමාන්‍ය ලාභාංශ මුල්‍යම ආකාරයෙන් හෝ කොටස් ආකාරයෙන් හෝ ප්‍රකාශයට පත් කරයි ලාභාංශ මුල්‍යමය ආකාරයෙන් පත් කිරිමේදී කොටසකට මුදල්මය අගයක් ලෙස ප්‍රකාශ කෙරේ එනම් කොටසකට නිශ්චිත මුදල් ප්‍රමාණයක් ලෙස ප්‍රකාශයට පත් කෙරේ

නිදසුන් : කොටසකට රු 2ශ50 ආදි වශයෙන්

□**පොළි**

ලැයිස්තුගත සමාගම් විසින් නිකුත් කරනු ලබන සාංගමික ණයකර මිලදී ගන්නා ආයෝජකයන්ට සමාගම විසින් වාර්ෂිකව පාළියක් ගෙවනු ලබයි ණයකර සඳහා ගෙවනු ලබන්නේ නිශ්චිත පොළියක් වන අතර එය ණයකර නිකුත් කිරිමේ දීම ප්‍රකාශ කරනු ලබයි

□**සංචිත ප්‍රාග්ධනීකරණය**

සමාගම සතුව පවතින සංචිත කොටස් ප්‍රාග්ධනය බවට පත් කිරිම මෙහිදී සිදුවේ මේ මගින් කොටස් හිමියන්ට අනුපාතයකට නව කොටස් ලැබීමක් සිදුවේ සංචිත ප්‍රාග්ධනීකරණය දී සමාගමෙහි ප්‍රකාශ කළ ප්‍රාග්ධනය වැඩිවීමක් සිදුවේ මෙම සංචිත ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය සඳහා කොටස් වෙළඳපොළෙහි පූර්ණ අනුමැතිය ලබා ගත යුතුය

- **<u>හිමිකම් නිකුතුව</u>**

හිමිකම් නිකුතුවක් යනු සමාගමේ දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට කිසියම් අනුපාතයකට අනුව කොටස් නැවත ලබා දීමයි හිමිකම් නිකුතුවකදි වෙළඳපොළේ මිලට වඩා අඩු මිලකට කොටස් ලබා ගැනීමේදී අවස්ථාව ආයෝජකයාට ලැබේ මෙසේ අඩු මිලකට කොටස් හිමිකර ගැනීමට හා එම හිමිකම වැඩි මිලකට විකුණා ලාභ අත්කර ගැනීමට හෝ ආයෝජකයාට අවස්ථාව ලැබීම හිමිකම් නිකුතුවක ප්‍රතිලාභයයි

- **<u>ප්‍රාග්ධන ලාභ</u>**

කිසියම් ආයෝජකයෙකු ගැනුම් මිලකට කොටස් විකුණුවේ නම් එමඟින් ඔහු ලබන්නේ ප්‍රාග්ධන ලාභයයි නිදසුනක් ලෙස කොටස් රු 30ට මිලදී ගත් පුද්ගලයෙකු කොටසක් රු 50කට විකුණන ලද්දේ නම් ඔහුට කොටසකින් රු 20ක ප්‍රාග්ධන ලාභයක් හිමි වේ කොටස් වෙළඳපොළ තුල ගනුදෙනු කරන ආයෝජකයන්ට ලැබිය හැකි ආකර්ෂණීය ප්‍රතිලාභය මෙම ප්‍රාග්ධන ලාභයයි

- **<u>වක්‍ර ප්‍රතිලාභ</u>**

- සමාගමක සාමාන්‍ය කොටස් හිමියන්ට ඡන්ද බලය හිමි වීම හා අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත් විය හැකිය
- රජයේ සුරැකුම්පත්වල මිලදී ගත් පුද්ගලයන්ට එය ලබා ගැනීමේදී ඇප සුරැකුම් ලෙස භාවිතා කළ හැකි වීම
- රජයේ සුරැකුම්පත්වල කරන ආයෝජනයේ අවදානම ඉතා අඩු මට්ටමක පැවතීම හා ඉහල ද්‍රවශීලතාවක් පැවතීම.
- කොටස් විකිණීමෙන් හිමි වන ප්‍රාග්ධන ලාභ බදුවලින් නිදහස් වීම
- කොටස් අවශ්‍ය විටෙ
- ක කොටස් වෙළඳපොලේ විකිණීමට හැකි වීම නිසා ඉක්මනින් මුදල් බවට පත් කළ හැකි වීම හා කොටස් ඉහල ද්‍රවශීලතාවයකින් යුතු වීම
- ප්‍රසාද නිකුතුවලට හිමිකම් ලැබීම

## කොළඹ කොටස් හුවමාරුවෙහි කාර්ය සාධනය මැනීම සඳහා යොදා ගන්නා මිල දර්ශක

කොටස් වෙළඳපොළක ගනුදෙනු ක්‍රියාකාරී ද? නැද්ද? යන්න විග්‍රහ කිරීම සඳහා පොදු සංඛේත දර්ශක රැසක් ලෝකයේ භාවිතා වේ

1 සියලු කොටස් මිල දර්ශකය. (ASPI) All Share price index

2 S @ P ශ්‍රී ලංකා 20 දර්ශකය (S @ P SL 20 Index)

3 මුළු ප්‍රතිලාභ දර්ශකය. (TRI) Total Return Index

-කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ සමාගම් සියල්ලේම ඡන්ද බලය හිමි සාමාන්‍ය කොටස්වල මිල ගණන්හි ඇති වන උච්චාවචන පෙන්නුම් කරන දර්ශකය සියලු කොටස් මිල දර්ශකයයි

මෙම දර්ශකය සඳහා සැකසීමේදී 1985 වසර පාදක වර්ෂය ලෙස යොදා ගන්නා අතර පාදක දර්ශක අගය 100 ලෙස යොදා ගනී

සියළු කොටස් මිල දර්ශකය පහත පරිදි ගණනය කරයි

සියළු කොටස් මිල දර්ශකය = සියුළු ලැයිස්තුගත සමාගම්වල වර්තමාන

වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය * 100

පදනම් වර්ෂයේ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය

- කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ විශාලතම සහ වඩාත් ද්‍රවශීල සමාගම් 20 ක මිල ගණන්වල වෙනස් වීම මැනීම සඳහා ගණනය කරනු ලබන දර්ශකය s @ p ශ්‍රී ලංකා 20 මිල දර්ශකය ලෙස හැඳින්වේ
- වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය
- ද්‍රවශීලතාවය
- මුල්‍ය ශක්‍යතාවය යන සාධක අනුව ඉහත සමාගම් 20 තෝරා ගනී.
- මෙම දර්ශකය සකස් කිරිමේදී 2004.12.17 ලෙසත් පාදක දර්ශකය අගය 1000 ලෙසත් යොදා ගනී.

s @ p ශ්‍රී ලංකා 20 මිල දර්ශකය පහත පරිදි ගණනය කරයි

- **s @ p** ශ්‍රී ලංකා 20

මිල දර්ශකය = තෝරා ගත් සමාගම් 20 හි

වර්තමාන ප්‍රාග්ධනීකරණය * 100

තෝරාගත් සමාගම් 20 හි

පාදක දිනයේ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය

- ඉහත දර්ශක වලට අමතරව මුළු ප්‍රතිලාභ දර්ශකද දෛනිකව සකස් කරයි මෙය 2004 වර්ෂයේ හඳුන්වා දුන් අතර මෙය කොටස් මිල වෙනස් වීම සහ ලාභාංශ ආදායම යන සාධක දෙකම සැලකිල්ලට ගනිමින් සකස් කරයි

- සියලු කොටස් මිල දර්ශකය මුළු ප්‍රතිලාභ යන පදනම යටතේ ගණනය කළ විට සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය (ASTRI) ලෙස ද S @ P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය මුළු ප්‍රතිලාභ යටතේ ගණනය කළ විට s @ p ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය (s@PTRI) ලෙස ද හඳුන්වයි.

## කොටස් වෙළඳපොළ මිල දර්ශකවල වැදගත්කම

- ආර්ථික ක්‍රියාකාරීත්වය පිළිබඳව යම් අවබෝධයක් ලැබිය හැකි වීම
- ආර්ථිකයෙහි සමාගම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව යම් අවබෝධයක් ලැබිය හැකි වීම
- වෙනත් රටවල කොටස් වෙළඳපොළ තත්වයක් සමඟ සංසන්දනය කළ හැකි වීම
- ආයෝජන තීරණ ගැනීමේදී ආධාර කර ගත හැකි වීම

END